# සවියෙන් පෙරට අපි එකට
# e - ඉගෙනුම් පාසල
# හොරණ අධ්‍යාපන කලාපය

**7 ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**2 වන වාරය**

**12 පාඩම - සිනා කුමරි**

**නිපුණතාව : 11-0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.**
**නිපුණතා මට්ටම : සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.**

## සැකසුම:

# බප/හො/ ලබුගම විජිත විද්‍යාලය

## ඩබ්ලිව්. එම්. පී. එම්. වීරසේකර මිය



# ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා

1 - 1913 ජුනි 19 වැනි දින බෙලිඅත්තට ආසන්නව පිහිටි පුවක් දණ්ඩාව නම් පිටිසර ගමෙහි උපත ලබා ඇත.

2 - හෙළ සාහිත්‍ය කෙත සරු කල විශිෂ්ට ගණයේ කවියෙකි.

3 - (1913 1964 )කවියෙකු ගීත රචකයෙකු මෙන්ම පුවත් පත් කලාවේදියෙකු ලෙස කීර්තිය දිනූවෙකි .

4 - බෙලිඅත්ත ශ්‍රී පඤ්ඤානන්ද විදුහලින් අධ්‍යාපනය ලද එතුමා පසුව ඉන්දියාවට ගොස් වංග සහ හින්දි යන භාෂා ඉගෙන භාරතීය සංස්කෘතිය ගැනද හැදෑරිය.

5 - කෝමල රේඛා පද්‍ය සංග්‍රහයේ ප්‍රස්තාවනාව අනුව එතුමා කාව්‍යකරණයට නැඹුරු වී ඇත්තේ අවට පරිසරය හා බැඳුණු අත්දැකීම් සහිතවයි.

6 - තම නිර්මාණ රස ගැන්වූයේ ඒ අත්දැකීම් පාදක කර ගනිමිනි.

7 - සිනා කුමරි රචනා වී ඇත්තේ ද එවැනිම වූ අත්දැකීමක් ඇසුරෙනි.

8 - රසවත් කවියක් නිර්මාණය කරන්නට තම අත්දැකීම් හා කවියා රසවත් යෙදුම් භාවිත කරන ආකාරය ගැන අවබෝධයක් තිබිය යුතුය.

9 - චන්ද්‍රරත්න මානවසිංහ මහතා හෙළදිව, ලංකාදීප පුවත්පත්වල කතුවරයෙකුණී සංස්කාරකවරයෙකු ලෙ ද භාෂාවට හා සාහිත්‍යයට විශාල සේවාවක් සිදු කර ඇත.

10 - මී කිරි , වෙසක් මිහිර, ගුරුගෙදර යන අතරමග, ඇත්ගාලේ දරු පෙම ,මගේ රට, මහ බෝ වන්නම මෙතුමාගේ ජනප්‍රිය කාව්‍ය නිර්මාණ වෙයි

11 - ළමයින් සඳහා ලියූ සේපාලිකා හා මනෝභාරත නාක නව ගීත නාටක සම්ප්‍රදායක් බිහි කිරීමට සමත් විය.

12 - සරස්වති අභිනන්දනය ද මෙතුමාගේ ගී පද රචනයකි

13 - කෝමල රේඛා නම් වූ චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ නිර්මාණ එකතුවෙන් සිනා කුමරි පද්‍ය පන්තිය උපුටාගෙන ඇති


14 - 1964 ඔක්තොම්බර් මස 04 වැනි දා ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා අභාවප්‍රාප්ත විය.

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් විසින් රචිත මෙම පද්‍ය පන්තිය  අසා රස විඳිමු.

httwww.youtube.com/watch?v=LbnwUv5o-ac

අපේ කවියා එනම් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් විසින් වෙසක් සමයේ සුන්දරත්වය, අසිරිය පිළිබඳ ව බාලදරු කෙනෙකු සිය මවගෙන් අසන ප්‍රශ්න හා ඒවාට ඇය දරුවාට සපයන පිළිතුරු ලෙසින් මෙම  පද්‍ය පන්තිය රචනා කොට ඇත.

12 සිනා කුමරි




කනට නොදැනෙන ලෙස සිතට දැනෙන ලෙසින් සිලි සිලි හඬ නංවමින් ජල තලාවල පිපෙන මල් වර්ගයක් වන (හෙල් මැලි ) සුදු ඕලු සුදු මානෙල් මල්වල සිනිඳු පෙති දිග හැරෙයි

2 ළා අඹ දළු නව නවා
දම් පාටින් ඔප දමා
සඳ කැන් මිණි කැට අස්සෙන්
උල්පත්වල කිමිදිලා

ලා අඹ දළු නවමින් දම් පැහැයෙන් ඒවා පාට කරමින් සඳඑළිය ඇති විට සුදු පාට මැණික් කැට උල්පත්වලින් මතුවෙයි.

2 කෙසෙල් ගසින් මතු වෙලා
ගොබය වටින් දැවටිලා
කිරි පාටට ඔපලා ගෙන
අහසට පැන පා වෙලා

කිරි පාටට කෙසෙල් ගසේ ගොබය පැන නගින විට ඒ ගොබයේ දැවටිලා අහසට පැන පා වෙයි මෙලෙස සඳ එළිය තවරාගෙන කිරි පාටින් දිලෙන කෙසෙල් ගොබ වර්ණනා කරයි.

3 නෙලුම් මලේ පෙති සලා
පුබුදුවමින් නොම තළා
බට්ට වටේ රේණු පොකුර
රතු පැහැයෙන් සරසලා

පෙති නොතැලී නෙළුම් මල් පිබිදෙන ආකාරය කවියා දක්වන්නේ එලෙසිනි.

4 නෙලුම් කොළේ නොම ඇලී
දිය බිඳුවක  ගැලි ගැලී
පෙරළි පෙරළි සෙල්ලම් කො
දිය රැල්ලට එක්වෙලා

නෙළුම් කොළයට දිය බිඳුවක් වැටුණු විට ඇලී නොසිටියි. එය පෙරළි පෙරළී ගොස් දිය රැල්ලට නැවත එකතු වෙයි .කවියා මෙම අවස්ථාව දක්වන්නේ නෙළුම් කොළ මත දිය බිංදු සෙල්ලම් කරන ආකාරය චිත්‍ර රූප නංවමිනි. ගැලි ගැලී, පෙරළි පෙරළී වැනි අනුප්‍රාසාත්මක යෙදුම් (කාවෝක්ති) යොදාගෙන ඇත.

5 ගහ කොළ නිදි අතරේදී
ලොව නිහඬව තිබියදී
රස ගීයක් අකුළා ගෙන
සිහිනවලට වැදි වැදී

ගහ කොළ මෙන්ම මුළු ලෝකයම නිහඬව තිබියදී රස ගීතයක් ගයා ඉවර වී සිහින දකියි .

6 මතුපිට නැග සුදු වලා
හිම කඳු පිට ගැවසිලා
හඳ එළියේ නිල් අහසේ
ඒ මේ අත ඇවිදලා

ුදු පාට වලාකුළු මතට නැග, හිම කඳු අතරට ගොස්, සඳ එළිය ඇති විට නිල් පාට අහසේ ඒ මේඅත ැවිදලා එයි. කවියා කඳු අතර වලාකුළු පාවෙන ආකාරය දක්වන්නේ එලෙසිනි

7 සිනිඳු කොපුව ඇද හෙළා
පුවක් මලක් විහිදලා
ඇත් දත් පාටින් මල් ඇට
කිනිති දිගේ අලවලා

ිනිදු ආවරණයක් ඇති පුවක් මල දිග හැරෙන විට ඇත්දළ පැහැති සුදෝ සුදු මල් ඇට පුවක් ිනිත්ත දිගේ අලවා තිබෙන්නා සේ පෙනෙයි. කවියා පුවක් මල පිපෙන අයුරු දකුවන්නේ එලෙසිනි

8 අතරේ දිග බඩවැටී
වැලි කහ මල්වල ගැටී
ඉඳුනිල් මිණි එළියක් දී
දැවටි දැවටි එක සැටී

9 බැස යන ගඟුලැල් පුරා
පෙණ පිඬුවල සැරි සරා
ගිරි ලෙන්වල කඳු ගුල්වල
අඳුර සමග නො කොඳුරා

බැස යන ගංගා දිය ඇලි වල ඇති පෙණ පිඬුවල සැරිසරමින් පර්වත ගුහාවල කඳු ගුහාවල අඳුරේ කොඳුරන්නේ නැතිව ගලාගෙන යයි නොයෙක් බාධක හමුවේ ඒවා පසු කරමින් ගංගාව ඉදිරියට යනආකාරය ඉතා චමත්කාරව ඉදිරිපත් කරයි.

10 මිණිතලයක තරු හෙළා
සඳුගෙන් ඇන අඹරලා
එම දූවිලි කුඩු පිඹ පිඹ
දේදුනුවල වැඩ දමා

11 සේපාලික මල් ගලා
රෑට හොරෙන් හොලවලා
නැටි රතු කර හෙවණැලි යට
බිම හැම තැන විසිරුවා

සේපාලිකා මල්වලින් පිරි ගැවසී ගත් අතු කිනිති ද සේපාලිකා මල් ගස් යට තැන තැන රතු පාට නැටි සහිත මල් විසිරී ඇති ආකාරයත් දක්වයි

12 දඟ කරමින් නට නටා
ඇවිදින මුළුලොව වටා
ගදඹ කුමයකි මොළකැටි
ඇති සුරතල් ගති නුරා

13 ඇය දුටු දන තුටු වෙතී
සිනා නමින් අමතතී
ඈ වෙත ළැදි නොවන කෙනෙකු
මේ මුළු ලොවෙහි ම නැතී

ඈ දකින ජනයා සතුටට පත් වෙතී 'සිනා' යන නමින් කතා කරතී . ඇයට ළැදි නොවන කෙනෙක් මුළු ලෝකයේම නැත.

14 මගේ තුන්මැසි දියණියගේ
රසවත් සිහිනය දිගේ
සිනා කුමරී නටන කලට
දිටිමි සියලු රුව ඇගේ

තුන්මසක් වයසැති තම සුරතල් දියණියගේ සිනාව දුටු කවියා ඒ සිනහවෙන් මුළු ලොවම පිබිදෙන බවත් සුන්දර වන බවත් පවසන්නේ අපූරු ආකාරයෙනි.

අරුත් පැහැදිලි කිරීම

1 සිලිලාරෙක - ජලතලාවක

2 හෙල්මැලි - සුදු මානෙල් සුදු ඕලූ

3 සඳකැන් මිණි කැට - චන්ද්‍රකාන්ත මාණික්‍ය සුදු මැණික්

4 උල්පත් - පොළව යට සිට උඩට දිය උනන තැන්

5 අකුළාගෙන - ඔතාගෙන

6 කොපුව - ආවරණය

7 ඉඳුනිල්මිණි - නිල් මැණික් (ඉන්ද්‍රනීල මාණික්‍ය)

8 ගිරිලෙන් - පර්වත ගුහා

9 මොළකැටි - මොළොක්

10 නුරා - ආදරණීය